ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | NWP/CS/F/35/1 | |
| ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | | |
| දිනය<br>திகதி<br>Date | 2023.02.02 | |

## පළාත් භාණ්ඩාගාර (මුදල්) චක්‍රලේඛ 02/2023

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,

ලේකම්,වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සභා ලේකම්,වයඹ පළාත් සභාව,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලුම පළාත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් සහ

සියළුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

**2008 පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සහ වයඹ පළාත් සභාවට අදාළ කරගෙන ඇති රාජ්‍ය මුදල් හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ පළාත් සභාවට උචිත අයුරින් සංශෝධනය කර පරිශීලනයට පහසු ආකාරයට එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම.**

2022.12.08 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 2023 සඳහා වූ අයවැයෙහි අන්තර්ගත යෝජනාවන්හි 35.1 වන යෝජනාව අනුව 2020, 2021 හා 2022 වර්ෂවලදී සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ සේවාවන් සඳහා දැනට අයකරනු ලබන විවිධ ගාස්තු 2023.01.01 වන දින සිට 20% කින් ඉහළ නැංවීමට තීරණය කර ඇත.

02. ඒ අනුව, මුදල් අමාත්‍යාංශය විසින් 2022.12.20 දිනැතිව නිකුත් කර ඇති රා.මු.ච අංක 01/2020(ii)න් රා.මු.ච.අංක 01/2020 හි II කොටසේ 5 ඡේදය සංශෝධනය කර ඇත. එබැවින්, පළාත් භාණ්ඩාගාර (මුදල්) චක්‍රලේඛ අංක 01/2021 හි II කොටසේ 5 ඡේදය පළාත් සභාවට පහත සඳහන් ආකාරයට සංශෝධනය කර වහාම ක්‍රියාත්මක කිරීමට ගරු ආණ්ඩුකාරවර අනුමැතිය 2023.01.20 දින ලැබී ඇති බව, ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක NWP/GOV/AD01/1/1/17/1 සහ 2023.01.25 දිනැති ලිපියෙන් දන්වා ඇත.

**"5. පළාත් සභා ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය."**

**5.1** 2020, 2021 සහ 2022 වර්ෂවලදී මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම පළාත් සභා ආයතන, එම ගාස්තු 20% ක උපරිමයකට යටත්ව සංශෝධනය කර, අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් තම පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ද සහිතව ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**5.2** යම්කිසි ගාස්තුවක් 20% කට වඩා වැඩි ප්‍රතිශතකින් වැඩිකිරීම හෝ ගාස්තු ව්‍යුහයේ (Structure) සංශෝධන සිදු කිරීම මහජන යහපත හෝ ආයතනයේ ඉදිරි පැවැත්ම සඳහා යෝග්‍ය බව හැඟෙන්නේ නම් ඒ සඳහා අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහ ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම වැඩි කිරීම සිදු කළ හැකිය.

**5.3** පළාත් සභාවේ සම්මත කර ඇති යම් කිසි ප්‍රඥප්තියක් මඟින් ගාස්තු සංශෝධනය කිරීම සඳහා විධිවිධාන සලස්වාගෙන ඇති ආයතන විසින් එම ප්‍රඥප්තිය ප්‍රකාරව ගාස්තු සංශෝධනය කළ යුතුවේ.

**5.4** ඉහත 5.1හා 5.2 පරිදි සිදු කරනු ලබන සංශෝධන වෙනුවෙන් අදාළ අනුමැතිය ලබාගැනීම සඳහා නියමිත ආකෘති පත්‍රය මඟින් පළාත් භාණ්ඩාගාරය වෙත යොමු කළ යුතුවේ. ඉහත 5.3 පරිදි සිදු කරනු ලබන සංශෝධන ද අදාළ ආකෘති පත්‍රය මඟින් පළාත් භාණ්ඩාගාරය වෙත දැනුම් දිය යුතුය. අදාළ ආකෘතිපත්‍රය මේ සමඟ අමුණා ඇත.

**5.5** පළාත් සභා ආයතන විසින් යම් නව ගාස්තුවක් හඳුන්වා දෙන්නේ නම් ඒ සඳහා පළාත් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

රංජිත් ආරියරත්න,

ප්‍රධාන ලේකම්,

වයඹ.

පිටපත්:-

1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ

**මාර්ගෝපදේශ අංක 10**
**රා.මු.ච. 01/2020 (II) හි 5.3 ඡේදය**

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි II කොටස 5.4 ඡේදය යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 10 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (II) හි 5.3 ඡේදය යටතේ නිකුත් කෙරෙන මෙම මාර්ගෝපදේශ අංක 10 මගින් සංශෝධනය කෙරේ.**

**<u>රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය පිළිබඳව අනුමැතිය ලබාගැනීම සඳහා වන ආකෘති පත්‍රය</u>**

**<u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (ii) හි 5.3 ඡේදය මගින් සංශෝධිත පරිදි</u>**

1. පළාත් අමාත්‍යාංශය/ආයතනය:
2. දෙපාර්තමේන්තුව:
3. ගාස්තු අයකිරීමේ අධිකාරය: පාර්ලිමේන්තුවේ සම්මත වූ පනතකින්/ගැසට් පත්‍රයකින්/වෙනත්
   (ගාස්තු අයකිරීමේ අධිකාරය ලැබී ඇත්තේ වෙනත් ආකාරයකින් නම් අදාළ විස්තර ඇමුණුමකින් ඉදිරිපත් කරන්න)
4. මුල් වරට ගාස්තු අය කරන ලද වර්ෂය :
5. අවසන් වරට ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය:
6. ගාස්තු සංශෝධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබන්නේ කුමන කාණ්ඩය යටතේ ද යන්න:
   (රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 (ii) හි 5.1 හෝ 5.2 වගන්තිය යටතේ ගාස්තු සංශෝධන වාර්තා කිරීම/2020-2022 වර්ෂයේ ගාස්තු සංශෝධන වාර්තා කිරීම)
7. ගාස්තු සංශෝධනය සම්බන්ධ තොරතුරු 7.1 වගුව මගින් ඉදිරිපත් කරන්න.

7.1 2023 වර්ෂය සඳහා ගාස්තු සංශෝධනය පිළිබඳව ඉල්ලුම් කිරීම

| I | II | III | IV | V | VI |
|---|---|---|---|---|---|
| **අනු අංකය** | **සපයනු ලබන්නා වූ සේවය** | **අවසන් වරට ගාස්තු සංශොධනය කරන ලද වර්ෂය** | **අවසන් වරට පැවති ගාස්තුව (රු.)** | **2023 යෝජිත ගාස්තුව (රු.)** | **එම ආදායම බැර කිරීමට අපේක්ෂිත ආදායම් ශීර්ෂය** |
| | | | | | |
| | | | | | |